www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

ඇමරිකා එක්සත් ජනපද සමාජවාදී සමානතා පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා
ශ්‍රී ලංකාවේ රැස්වීම් අමතයි

# "අපගේ ව්‍යායාමය වන්නේ කම්කරුවන් ජාත්‍යන්තරව ඒකාබද්ධ කිරීම ය"

## US SEp Presidential candidates addresses Sri Lanka meeting
## "Our cacmpaign try to unify workers internationally"

**බිල් වෑන් ඕකන් විසිනි / 2004 ඔක්තෝබර් 29**

*ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප) කොළඹ දී සහ මහනුවර දී පැවැත් වූ සාර්ථක රැස්වීම් දෙකක් අමතා එක්සත් ජනපදයේ එහි සහෝදර පක්ෂයේ ජනාධිපතිධුරාපේක්ෂකයා වූ බිල් වෑන් ඕකන් කතා කලේ ය. ඉරාක යුද්ධය සහ එක්සත් ජනපද ජනාධිපතිවරනය යන මැයෙන් ඔහු පැවැත්වූ දේශනය මෙහි පහත පලවේ.*

ලග එන එක්සත් ජනපද ජනාධිපතිවරනය සහ ඉරාක යුද්ධය පිලිබඳ ව ලංකාවේ ශ්‍රාවකයක් ඇමැතීමට ලබා දුන් මෙම අවස්ථාව ගැන මම බෙහෙවින් ම කෘතඥ වෙමි. ඇමරිකාවේ ජනාධිපතිවරනයට ඉතා ආසන්න සති තුල දී සමාජවාදී සමානතා පක්ෂය තම ජනාධිපතිධුර අපේක්ෂකයා යුරෝපයේ සහ දකුනු ආසියාවේ ශ්‍රාවක ඇමතීමට යැවිය යුතු යයි තීන්දු කලේ මන් ද යන්න පිලිබඳව ශ්‍රී ලංකාවේ මෙන් ම එක්සත් ජනපදය තුල ද ප්‍රශ්න කර තිබෙන බව මම දැන සිටිමි.

මෙය මෙසේ කරන ලද්දේ මට වඩා හොඳ මාධ්‍ය ප්‍රසිද්ධියක් ලබා ගැනීමේ අදහසින් යයි කොළඹ එක්තරා මාධ්‍ය පන්ඩිතයෙක් යෝජනා කලේ ය. එහෙත් මෙම ප්‍රශ්නය ඇමරිකානු ජනාධිපති අපේක්ෂකයෙක් ශ්‍රී ලංකාව තුල මාධ්‍ය ප්‍රසිද්ධියක් ලබා ගැනීමට උත්සාහ කරන්නේ මන් ද යන සුපැහැදිලි ප්‍රශ්නය මග හරියි. මෙය මගේ ඡන්ද වැඩි කර ගැනීමට ආධාර වේ යයි මට නම් නොසිතේ.

නැත; ඉහත ප්‍රශ්නය ගලා එන්නේ මගේ පක්ෂයේ ජාත්‍යන්තර ඉදිරිදර්ශනයෙනි. 2004 ජනාධිපතිවරන ව්‍යායාමයේ දී අප ඉදිරියේ ඇති ඉතාමත් වැදගත් කර්තව්‍යය වන්නේ කම්කරු පන්තිය ජාත්‍යන්තරව එක්සත් කිරීම ය; එම ව්‍යායාමය තුල දී සෑම රටකම කම්කරුවන්ගේ ආවශ්‍යකතා නියෝජනය කිරීම ය. සමාජවාදී සමානතා පක්ෂයේ ජනාධිපතිවරන ක්‍රියාමාර්ගය මෙසේ ප්‍රකාශ කරයි:

"එක්සත් ජනපදයේ ගෝලීය බලපෑම සලකා බලන කල්හි, ඇමරිකානු ජනාධිපතිවරයකු තෝරා ගැනීමට සහභාගිවීමට සෑම රටකම වැසියන්ට ඉඩකඩ සැලසීම මුලුමනින් ම යෝග්‍ය වනු ඇත."

එක්සත් ජනපද අධිරාජ්‍යවාදය විසින් ගනු ලබන මග හා ඇමරිකානු ජනාධිපතිවරුන් විසින් ගනු ලබන පියවර ලෝක ගෝලය වටා වෙසෙන බිලියන සංඛ්‍යාත ජනයාට සැබැවින් ම ජීවිතයත් මරනයත් පිලිබඳ ප්‍රශ්න මතු කරයි. එක්සත් ජනපදය ඊනියා "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" ලොව පුරා ඇරඹීමත් සමග එරට, ලොවෙහි සාතිශය අස්ථායිකාරී බලවේගය බවට පත්ව ඇත. එක්සත් ජනපද ආන්ඩුව ඉරාකයෙහි කරගෙන යමින් සිටින්නේ නග්න යටත් විජිතවාද සමය කරා ආපසු යාම නිරූපනය කරන යුද්ධයකි. තම අභිමතය පරිදි ඕනෑම රටකට එරෙහිව පූර්වභංග - එනම්, අප්‍රකූපිත යුද්ධයක් ගෙන යෑමේ අයිතිය තමන් වෙත පවරාගෙන සිටින එක්සත් ජනපද ආන්ඩුව එමගින්, කලින් යටත් විජිත වශයෙන් පැවති රටවලට පමනක් නො ව සැබැවින් ම ලොව පුරාම වෙසෙන ජනතාවට සෘජු තර්ජනයක් එල්ල කර සිටී.

ලොව ඈත එපිට රටවල් පවා දැනටමත් එහි ආදිනව අත්විඳිමින් සිටිති. ශ්‍රී ලංකාවේ හා අනිකුත් රටවල ජීවන වියදම ඉතාමත් අනපේක්ෂිත හා පීඩාකාරී ලෙස ඉහල යාමට මං පෑදූ ඛනිජ තෙල් මිලෙහි සර්පිලාකාරී නැග්ම, පර්සියානු බොක්කෙහි එක්සත් ජනපද ආන්ඩුවේ සැහැසි යුදවාදය හා සෘජුව බැඳී පවතී.

එක්සත් ජනපද ආන්ඩුව හා එය ආධිපත්‍ය පවත්වාගෙන යන ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුව වැනි ජාත්‍යන්තර ආයතන ශ්‍රී ලංකාව වැනි රටවල ආන්ඩු සැකසුරුවම් හා කප්පාදු පිලිවෙත් පිලිපැදිය යුතු යයි බලකර සිටී. ආන්ඩු බලය එක් පක්ෂයකින් තවත් පක්ෂයකට මාරුවී ගිය ද මේ අරපිරිමැසුම් පියවර නොවෙනස්ව පවතී. මන්ද යත්, එම පියවරයන් වෙනත් ස්ථානයන්හි දී මූලිකව ම, වොෂින්ටනයෙහි දී ගැනුනු දේශපාලන තීන්දුවල ප්‍රතිඵල වන නිසා ය.

එමනිසා, මේ මැතිවරනයේ දී ඔබට ඡන්දයක් තිබිය යුතු බවත්, මා වැනි අපේක්ෂකයෙකු ඔබේ සහාය අයැ

ද සිටිය යුතු බවත් අප කියන කල්හි අප එසේ කරන්නේ සිත්ගැනීම සඳහා නො වේ. අප පක්ෂයෙහි ජාත්‍යන්තරවාදය ස්ථිරවම පදනම් වන්නේ භූගෝලීය ධනවාදී ආර්ථිකය, දේශපාලනය හා ලොව සෑම රටෙහිම කම්කරුවන් මුහුන දෙන වඩවඩාත් පොදු වන ගැටලු මත ය.

ඇමරිකානු කම්කරු පන්තියට හෝ ලොව අනිකුත් රටවල කම්කරු පන්තියට හෝ ජාතික විසඳුමක් නොමැත. ලබාගත හැකි ලාභතම ශ්‍රමය සොයා ලොව පීරා යන අන්තර් ජාතික සංගත, ගෝලීය පරිමානව ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකාවේ නිදහස් වෙලඳ කලාපවල සේවය කරන කම්කරුවන්ට මෙන් ම, එක්සත් ජනපදයෙහි කම්කරුවන්ට මෙසේ දැනුම් දෙනු ලැබේ: අප පිලිගන්වන වැටුප් හා කොන්දේසි භාරගනු; නැතිනම්, අපි වෙනත් රටක් කරා නිෂ්පාදනය ගෙන යමු. මෙහි ප්‍රතිඵලය වනුයේ භූගෝලීයව වැඩ කරන ජනතාවගේ ජීවන තත්වයන් ඇද වැටීම ය.

ජාතික දේශසීමා හරහා සෑම රටකම කම්කරුවන්ගේ අරගල එක්සත් කිරීම තුලින් පමනි ධනවාදය පරාජය කල හැක්කේ. අධිරාජ්‍යවාදයෙහි හදවත තුලම අධිරාජ්‍යවාදයට වෛෂයිකව විරුද්ධ වන බලවේගයක් පවතී - ඒ ඇමරිකානු කම්කරු පන්තියයි. එනමුදු එයට සමාජවාදය වෙනුවෙන් පොදු ජාත්‍යන්තර සටනකින් පිටස්තරව සාර්ථකත්වයක් ලැබිය නො හැකි ය.

සත්තකින්ම, මා මේ රටට පැමින සිටින්නේ ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය මට ආරාධනය කල නිසා ය. මෙම ශ්‍රී ලංකාවේ ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය නිරත වූ අරගලය හා සමාජවාදී ජාත්‍යන්තරවාදය පිලිබඳව අප පක්ෂයේ සාරභූත ඉදිරිදර්ශනය අතර ඇත්තේ දීර්ඝ හා ප්‍රගාඪ සබඳතාවයකි.

## ඇමරිකානු ට්‍රොට්ස්කිවාදය හා ශ්‍රී ලංකාව

අප ලෝක ව්‍යාපාරය වන හතර වන ජාත්‍යන්තරයට පදනම් වූ විප්ලවකාරී සමාජවාදී ජාත්‍යන්තරවාදයේ ඉදිරිදර්ශනය තීරනාත්මක ආකාරයකින් ප්‍රතික්ෂේප කරමින්, ලංකා සමසමාජ පක්ෂය බන්ඩාරනායක මහත්මියගේ ධනේශ්වර හවුල් ආන්ඩුවට ඇතුලු වී කලා වූ 1964 මහා පාවාදීමේ 40 වන සංවත්සරය යෙදී ඇත්තේ මෙම වසරට ය.

ඇමරිකාවේ අප පක්ෂය ස්ථාපිත කල දේශපාලන ප්‍රවනතාවය, එවකට එක්සත් ජනපදයෙහි ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය වූ සමාජවාදී කම්කරු පක්ෂය (සකප) තුල සුලුතර කන්ඩායමක් ලෙස ඇරඹුනි. සකපයේ නායකත්වය ගමන් කලේ ද ලසසපය ගමන් කල දිශාවට ම ය. කම්කරු පන්තියේ ජාත්‍යන්තරවාදය හා දේශපාලන ස්වාධීනත්වය ප්‍රතික්ෂේප කල එම පක්ෂය ඒ වෙනුවට කස්ත්‍රෝවාදය, ගරිල්ලාවාදය හා අනිකුත් නිර්ධන පන්තියෙන් පිටස්තර බලවේග වැනි ආදේශක සොයා ගියේ ය.

1964 වසරේ ලසසපයේ ක්‍රියාව ජාත්‍යන්තර වශයෙන් ඓතිහාසික සැතපුම් කනුවක් සලකුනු කලේ ය. හතරවැනි ජාත්‍යන්තරය හා ඓතිහාසිකව සම්බන්ධ වූ පක්ෂයක් පලමුවැනි වතාවට ධනේශ්වර ආන්ඩුවකට ඇතුලු වී තිබුනි. අධිරාජ්‍යවාදය වෙනුවෙන් ඍජු මුක්කුවක් වීමේ සංශෝධනවාදයේ භූමිකාව එලිපිට ප්‍රදර්ශනය වුනි.

මේ සිද්ධිය හා ලෝක ව්‍යාපාරය කෙරේ එහි ගම්‍යයන් පිලිබඳව සාකච්ඡාවක් සමාජවාදී කම්කරු පක්ෂය තුල පවත්වන ලෙස ඇමරිකානු අප ප්‍රවනතාවය ඉල්ලා සිටියේ ය. ඇමරිකානු පක්ෂයෙහි නායකත්වය මෙයට ප්‍රතිචාරය දැක්වූයේ සාකච්ඡාවක් ඉල්ලා සිටි අය පක්ෂයෙන් නෙරපා දැමීම තුලිනි. පක්ෂයෙන් පහ කල අය සමාජවාදී සමානතා පක්ෂයේ පූර්වගාමී සංවිධානය පිහිටුවීමට ක්‍රියාකරමින් එක්සත් ජනපදයෙහි ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ ඓතිහාසික අඛන්ඩතාවය රැක ගත්හ.

කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය හා ජාත්‍යන්තර එකමුතුකම වෙනුවෙන් සටන මත ස්ථිරවම පදනම් වූ මැතිවරන ව්‍යාපාරයක යෙදීමේ අපගේ හැකියාව මේ අනුව ශ්‍රී ලංකාවෙහි ට්‍රොට්ස්කිවාදය වෙනුවෙන් සටනෙහි කටුක පාඩම් හා නොබෙදිය හැකි ලෙස බැඳී ඇත. එක්සත් ජනපදයෙහි හා ශ්‍රී ලංකාවෙහි අප පක්ෂ, විශේෂයෙන් පසුගිය දශක දෙක ඇතුලත ස්ථාපිත කිරීමට සමත් වී ඇති සමීප සහයෝගීතාවය තුලින් මෙම ඉදිරිදර්ශනය ප්‍රමාන කල නොහැකි අන්දමට ශක්තිමත් වී ඇත.

මේ වර්ෂයේ ඇමරිකාවේ ජනාධිපති මැතිවරනය, අන් සියල්ලටම වඩා ඉරාකයෙහි දිගටම පවත්නා යුද්ධය පසුබිම් කොට ගෙන පැවැත්වේ. ඒ අනුව, එක්සත් ජනපද දේශපාලනය පාලනය කරනු ලබන්නේ ජාත්‍යන්තර සිද්ධීන් මගිනි. එනමුදු, ඉරාක ජනතාව මත පටවන ලද ජන ඝාතන හා අතිවිශාල මිනිස් දුක් වේදනා පිලිබඳ ව ප්‍රධාන මහා ව්‍යාපාරික පක්ෂ දෙක වන ඩිමොක්‍රැටික් හා රිපබ්ලිකන් පක්ෂවල අපේක්ෂකයින් අතර විවාදවල මොනම සඳහනක් හෝ ඇත්තේ නැත.

මෑත සති තුල දී ඉරාකයේ ෆලූජා නගරය හා වෙනත් ස්ථාන මත එක්සත් ජනපදය විසින් දිනපතා බෝම්බ හෙලනු ලැබේ. ඒ තුලින් අහල පහල සියලු දෑ සිඳ බිඳ දමා ඇති අතර මුලු පවුල් පිටින් ම වනසා දමනු ලැබ ඇත. තමන් ඝාතනය කරන්නේ "ත්‍රස්තවාදීන්" බවත් එමගින් තමන් ඉරාකයට ස්ථාවරභාවය ගෙන එන බවත් පෙන්ටගනය නිතිපතා තරයේ කියා සිටියි.

එනමුදු මේ ප්‍රහාරවල සැබෑ ඉලක්ක සිවිල් ජනතාව බව ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ්ගේ පාලන අධිකාරියෙහි හා එක්සත් ජනපද යුදහමුදාව තුල සිටින වඩාත් කෙලින් කතා කරන නිලධාරිහු පිලිගනිති. ඉරාක ප්‍රතිරෝධී සටන්කරුවන් භාරදෙන ලෙසත්, එසේ නැත්නම් මරනයට මුහුන දෙන ලෙසත් ඔවුන්ට දන්වනු ලැබේ. මේ උපාය මාර්ගය, 1940 ගනන්වල නාසීන් අල්ලා ගත් යුරෝපය තුල ප්‍රතිරෝධය පොඩි පට්ටම් කිරීමට

උපයෝගී කර ගැනුනු සාමූහික දඬුවම යලි, ක්‍රියාත්මක කිරීමකි. මෙය වනාහී 1949 වසරේ සිව්වැනි ජිනිවා සම්මේලනය මගින් එය යුද අපරාධයක් ලෙස නීතියෙන් තහනම් කරන ලද භාවිතයකි.

වඩාත් ලේවැකි අපරාධ ඉදිරියේ දී සිදු කෙරෙනු ඇත. එක්සත් ජනපද හමුදාවට අයත් විශාල සංඛ්‍යාවක් අනතුරට ලක්වුවහොත් ඡන්ද විමසීමෙහි දී එය බුෂ්ට අහිතකර ලෙස බලපෑ හැකි ය යන බිය නිසා ඉරාක නගරවලට එරෙහිව පූර්න පරිමානයේ පාබල ප්‍රහාරයක් මැතිවරන දිනය ඉක්මෙන තෙක් පමාකර ඇතැයි පාලන අධිකාරියේ නිලධාරීහු පිලිගෙන ඇත්තාහ.

මෙයට ඩිමොක්‍රැටික් පාක්ෂිකයන්ගේ හා ඔවුන්ගේ අපේක්ෂකයා වන ජෝන් කෙරීගේ ප්‍රතිචාරය කුමක් ද? දේශපාලනය යුද්ධයට බාධාවක් බවට පත්වීමට ඉඩ දී ඇතැයි බුෂ්ට චෝදනා කරමින් ඔවුන් මේ පමා කිරීම හෙලා දැක ඇත. අන් අයුරින් දක්වතොත්, ඔවුන්ට අවශ්‍යවන්නේ රුධිරගංගා ක්ෂනිකව ආරම්භ කිරීමට ය.

යුද්ධය වූ කලි, ඇමරිකානු ධනවාදයේ හා ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදයේ ඓතිහාසික අසාර්ථකත්වයේ පද්ධතිමය අර්බුදයක විපාකයකි. යුද්ධය සඳහා ඉදිරිපත් කෙරුනු හේතු දෙකම ව්‍යාජ බව ද ඉරාකය තුල ජන සංහාරක අවි තිබුනේ නැති බව ද, ඉරාක තන්ත්‍රය හා ඇල් කයිඩා ත්‍රස්තවාදී ජාලය අතර කිසිදු සබඳතාවක් නොතිබූ බව ද ඇතැම් විට බුෂ් හා ඔහුගේ උපජනාධිපති ඩික් චේනි හැරුනු විට සියල්ලන් විසින් ම පිලිගත් හා දැන් පිලිගනු ලැබ ඇත. එක්සත් ජනපද ආන්ඩුවේ ම වාර්තාවලින් මෙය සනාථ වේ.

එනමුදු, යුද්ධය ඇරඹීමට බොහෝ කලකට පෙරාතුව මේ සියල්ල ප්‍රත්‍යක්ෂව තිබුනි. ඇත්තවශයෙන් ම අප ව්‍යාපාරය මෙය නොකඩවාම පෙන්වා දී තිබේ. එය තහවුරු කිරීම සඳහා පල කරන ලද ප්‍රකාශන හා ලිපි අප අන්තර්ජාල අඩවිය වන *ලෝක සමාජවාදී වෙබ් අඩවියෙහි* ඇත. මෙය කලේ අප පමනක් නොවේ. යුද්ධයට යෑම පිලිබඳ එක්සත් ජනපදයේ සාධාරනීකරනයන් ව්‍යාජ ඒවා බවට යුද්ධය ඇරඹීමට බොහෝ කලකට පෙරාතුව, බොහෝ ස්වාධීන විශ්ලේෂකයන් පමනක් නොව ආන්ඩුවේ නිලධාරීහු ද අවි පරීක්ෂාකරන්නෝ ද පවා පැවසූහ.

බුෂ් පාලන අධිකාරියේ දේශපාලන විපක්ෂය යයි පෙනී සිටින ඩිමොක්‍රැටික් පක්ෂය හෝ එක්සත් ජනපද ජනමාධ්‍ය හෝ මේ ව්‍යාජ ප්‍රකාශනවලට අභියෝග කිරීමට හෝ ඒවාට පාදක වූ යථාර්ථය පිරික්සීමට හෝ ඉදිරිපත් නො වූහ; ඒ වෙනුවට, බුෂ්ගේ මුසාවන් යලි යලිත් කියාපෑමෙන් සෑහීමකට පත් වූහ. එම මුසාවන් යලි යලිත් ගිරා බසින් බිනූවන් අතර කැපී පෙනුනු පුද්ගලයෙකි, ඩිමොක්‍රැටික් පක්ෂයේ අපේක්ෂකයා වශයෙන් බුෂ්ට එරෙහිව ඉදිරිපත් වී සිටින ජෝන් කෙරී.

මේ රැවටීමේ දී ප්‍රධාන පක්ෂ, කොන්ග්‍රසය, ජනමාධ්‍ය හා එක්සත් ජනපද සංගත - කෙටියෙන් කියතොත්, මුලු පාලක සංස්ථාපිතයම - දෙන සහාය පැහැදිලි කල හැක්කේ, ඇමරිකාවෙහි පාලක ප්‍රභූවට සෑහෙන එකඟතාවකට පැමිනිය හැකි මූලෝපායක් පෝෂනය කිරීමට එම මුසාව ආධාරක වී ය යන සාධකය තුලින් පමනි. ලොව පුරා ප්‍රධානතම ඛනිජ තෙල් හා ගෑස් නිපදවන කලාප හරහා එක්සත් ජනපද පාලනය ස්ථාපිත කිරීම සඳහා යුදහමුදාමය බලය උපයෝගී කර ගැනීම මෙම මූලෝපායට අන්තර්ගත විය. මෙය එක්සත් ජනපදය බරපතල ලෙස පරිහානිගත වීමේ තතු තුල වොෂින්ටනයෙහි ආධිපත්‍ය සහතික කිරීමට ගන්නා ලද සාහසික වෑයමක් විය.

පර්සියානු බොක්කෙහි හා කැස්පියන් මුහුද අසබඩ ඛනිජ තෙල් හා ස්වභාවික ගෑස් සංචිතවල පාලනය තම අතට පත් කර ගැනීම මගින් ඉල්ලුම වර්ධනය වන හා සංචිත ක්ෂය වන තත්වයන් යටතේ එක්සත් ජනපදය ධනේශ්වරයෙහි ඉන්ධන සැපයුම රැක ගැනීමට හැකි වනු ඇතැයි තර්ක කෙරිනි. ඒ සමගම, පවත්නා හා විභව ප්‍රතිමල්ලයන් මත සිය ආධිපත්‍ය පැතිරවීමේ තත්වයන් එමගින් තහවුරු කොට ගෙන ඔවුන්ට බල ශක්ති සලාක පැනවීමට වොෂින්ටනයට හැකි වනු ඇතැයි ද තර්ක කරන ලදි.

මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ දෙවැනි ලෝක සංග්‍රාමයෙන් අනතුරුව නුවූ විරූ අධිරාජ්‍යවාදී ආක්‍රමනයක් දියත් කිරීම යි. එය මානව වර්ගයාගේ සාමූහික විඥානයෙහි කෙටී තැබෙනු ඇත්තේ අබු ග්‍රයිබ් සිරකඳවුරෙහි එක්සත් ජනපද බලකායයන් ඉරාක සිරකරුවන්ට වධහිංසා පැමිනවීමේ අපරූපී මූර්තීන් තුලින් හා එක්සත් ජනපද බෝම්බ හා මිසයිල මගින් කුඩුපට්ටම් කරන ලද නිවාසවල නටබුන් අතරින් ඉරාක ජනයාගේ මල කඳන් ඇදගැනීමේ දසුන් තුලිනි.

මෙය වනාහී කුරිරු බව පමනක් නොව, දූෂනය හා හුදු අදක්ෂතාවය විසින් විලක්ෂනය කෙරුනු යුද්ධමය මැදිහත් වීමකි. රට අල්ලා ගැනීමෙන් මාස 18කට වැඩි කාලයක් ගත වී තිබුන ද, බැග්ඩෑඩ් නගරයෙහි මධ්‍යය පවා ආරක්ෂිතව තබා ගැනීමට එක්සත් ජනපද බලධාරීහු අසමත් වී සිටිති; එය ගරිල්ලා ප්‍රහාර අරක් ගත් පිටියකි. ප්‍රධාන නගරවලට විදුලි බලය සැපයීමට මෙම බලධාරීන් සමත්ව ඇත්තේ වරුවක් ඇර වරුවකට වැඩි අන්දමකට නොවේ. ඒ නිසා ආර්ථික නිෂ්පාදනය, මූලික සනීපාරක්ෂාව ජල පිරිපහදුව හා ශිෂ්ට සම්පන්න ජීවන තත්වයන් සාක්ෂාත් කිරීම ඉටුකරගත නොහැකිව ඇත.

ඉතාමත් මූලික වූ ආයතන එනම් රෝහල් හා පාසල් පවතින්නේ පසුගිය වසරේ සිදු වූ එක්සත් ජනපද ආක්‍රමනයෙන් හා මහා කොල්ලකෑම්වලින් අනතුරුව දරුනු ලෙස බිඳ වැටී ඇති තත්වයක ය. මේ අතරවාරයෙහි බුෂ් පාලනාධිකාරය සමග දේශපාලන සබඳකම් සහිත සමාගම් ඉරාකය ප්‍රතිනිර්මානය සඳහා වෙන් කර ඇතැයි කියනු ලැබූ මුදල් විශාල වශයෙන් ගසා කෑම මගින් මහා ලාභ කුට්ටි අත්කර ගත්හ.

ඉතා කෙටි කාල පරාසයක් තුල සමස්ත ඉරාක ජනකායම තමන්ට සතුරු කර ගැනීමට වොෂින්ටනය

සමත් වී ඇත. සෑම එක්සත් ජනපද සේනාංකයක් ම පාහේ දැනටමත් ඉරාකය තුල සිටින, හෝ ලඟදී එහි සිට සියරටට පැමිනි හෝ යලි එහි යැවීමට සූදානම් කෙරෙන හෝ තතු යටතේ නොකඩවා වර්ධනය වන සන්නද්ධ කැරැල්ලකට වොෂින්ටනය මුහුන දී සිටී. යන්තමින් මිලියන 26ක ජන ගහනයක් ඇති දුප්පත් රටක් ආක්‍රමනය කිරීම ලොව බලගතුම බලවේගය යයි කියනු ලබන එක්සත් ජනපද මිලිටරි යන්ත්‍රය බිඳවැටීමට ආසන්න තත්වයකට ඇද වැටී ඇත.

## කෙරී හා ඉරාක යුද්ධය

ඇමරිකානු දේශපාලන සංස්ථාපිතයේ කවර කොටසක් හෝ යුද්ධය අවසන් කිරීමට යෝජනා කරන්නේ නැත. ඩිමොක්‍රැටික් පාක්ෂික කෙරී 2002 වසරේ දී යුද්ධයට පක්ෂව ඡන්දය පාවිච්චි කලේ ය. ඉන් පසුව, යුද්ධයට විරුද්ධ අයෙක් ලෙස පෙනී සිටියේ ය. ඒ, මේ ධනේශ්වර පක්ෂය අධිරාජ්‍යවාද වලකාලීමේ මාධ්‍යයක් බවට පත් කල හැකි යයි වැරදි සහගත විශ්වාසයක එල්බගෙන සිටි ඩිමොක්‍රැටික් පාක්ෂික කොටස්වල සහාය ලබාගැනීම සඳහා ය. තමාට ඩිමොක්‍රැටික් පක්ෂයේ ජනාධිපති නාම යෝජනා ලැබීමෙන් අනතුරුව, ඔහු තම විරෝධය පෑමේ ව්‍යාජය අත්හලේ ය.

"අප දැන් දන්නා දෙය එනම්, ජනසංහාරක අවි ඉරාකය අත නැති බව ද ත්‍රස්තවාදීන් සමග ඉරාකයෙහි සබඳකම් නැති බව ද කල්තබාම දැන සිටිය ද ඉරාකය ආක්‍රමනය කිරීමට බුෂ්ට බලය පැවරීමට තමා ඡන්දය දෙනු ඇති බව ඔහු අගෝස්තු මස දී ප්‍රකාශ කර සිටියේ ය. මේ අත්‍යසාමාන්‍ය ප්‍රකාශය හොඳින් පිරික්සා බැලීම වටී. මන්ද යත්, සත්‍ය තත්වය නම්, යුද්ධයට යෑමට බුෂ්ට බලය පවරාදුන් නීති සම්පාදනය කරන ලද්දේ, නිශ්චිතව ම එවන් අවි හා එවන් සබඳකම් පැවතියේ ය යන්න මත හෙයිනි.

මෙවැනි ආස්ථානයක් සම්බන්ධයෙන් කල හැකි එකම දේශපාලන වශයෙන් අගමුල සහිත පැහැදිලි කිරීම නම්, මහා ව්‍යාපාර නියෝජනය කරන මේ පක්ෂ දෙකෙහි ම - එවකට ද - දැන් ද - මේ ප්‍රකාශ මුසාවන් බව දැන සිටියේ ය යන්න වේ. ඉහත සඳහන් දෑ කියාපාන ලද්දේ හුදෙක් තම ආක්‍රමනයට ව්‍යාජයක් සැපයීම සඳහා ය. අවසානයක් නොදකින "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" මෙන් ම මේවා ද සැලසුම් කරන ලද්දේ අධිරාජ්‍යවාදී යුද ආයාසයට අවනත කර ගැනීම සඳහා ඇමරිකානු ජනතාවට තර්ජනය කොට බිය වැද්දීමේ උවමනාකම සහිතව ය.

කෙරීගේ මැතිවරන ව්‍යාපාරය, යුද්ධයට එරෙහි වීමේ මාධ්‍යයක් සපයනු ඇතැයි බොලඳ අන්දමට අපේක්ෂා කල අය අතර ඔහුගේ ප්‍රකාශය බලවත් කලකිරීමක් ජනිත කලේ ය. තම ගමන් මග නැවත වරක් ආපසු හරවමින් යුද්ධයට යෑමේ තීරනය විවේචනය කිරීම මගහැරිය නොහැකි යයි කෙරීට හැඟී ගියේ ය. හුදෙක් මැතිවරන ආස්ථානයකින් ගත් කල්හි, බුෂ් පාලනාධිකාරියේ ඉරාක පිලිවෙතට අභියෝගයක් එල්ල කිරීමෙන් තොරව, මැතිවරන ව්‍යාපාරයක් ගෙන යෑමේ වෑයම, දේශපාලන සියදිවි හානි කර ගැනීමේ ස්වරූපයක් ගන්නා බවට තහවුරු වුනි. මත විමසුම්වල දී කෙරීගේ තත්වය වේගයෙන් පහතට වැටී ඇති බව පෙනී ගියේ ය. වඩාත්ම ප්‍රපාතීය පිරිහීම ඇතිවූයේ ඩිමොක්‍රැටික් පක්ෂයේ අපේක්ෂකයාට "තදින්ම කැපවූවන්" යයි හඳුන්වා ගත් පුද්ගලයින්ගේ ප්‍රතිශතයෙහි ය.

එසේ වුව ද ඔහුගේ නව හැරීමට හේතු වූ වඩාත් සාරභූත සාධකය වූයේ බුෂ් පාලන අධිකාරය ඉරාක යුද්ධය මෙහෙය වූ අන්දම ගැන පාලක ප්‍රභූව තුල ම භේද වැඩී ඒම ය. බුෂ් වෙත කෙරී එල්ල කල ප්‍රහාරය විදහා දක්වන්නේ බුෂ් යුද්ධය මෙහෙයවන ආකාරය එක්සත් ජනපදයට ව්‍යසනය ලං කරන්නේ ය යයි පාලක පන්තියේ ඇතැම් කොටස් දරන මතයයි. යුද්ධයකට ගෙනයෑමෙන් රට නොමඟ යැවීම පිලිබඳ ඉඳහිට පාලනාධිකාරිය හෙලා දකින නමුත් කෙරීගේ විවේචනය කේන්ද්‍රීයව ම යොමු වන්නේ, රාජ්‍ය තාන්ත්‍රිකව හෝ යුදහමුදාමයව හෝ, වශයෙන් ප්‍රමානවත් සූදානමක් කිරීමට බුෂ් අසමත් වූ බවටත් ඉරාකය අල්ලා ගැනීමෙන් පසු ඔහුගේ පාලනාධිකාරය ඇති කර ගත් විජිත පාලනය වැරදි ලෙස කලමනාකරනය කල බවත් ය.

යුද්ධය අනවශ්‍ය එකක් වූ බවටත් පාලන අධිකාරිය ඇමරිකානු ජනතාවට බොරු කී බවටත්, කෙරී නොයෙක් අවස්ථාවල ඉඟි කොට ඇත. ජාත්‍යන්තර නීතියෙහි පැහැදිලි විධිවිධාන යටතේ ව්‍යාජ හේතූන් මත පදනම මත මෙහෙය වන අනවශ්‍ය යුද්ධයක්, යුද අපරාධයක් ලෙස ගැනේ. නියුරෙම්බර්ග්හි නඩු විභාග කොට එල්ලා මරන ලද ජර්මානු නාසිවරුන්ට එරෙහිව ඉදිරිපත් කරන ලද චෝදනා පත්‍රයට මූලිකම පදනම වූයේ එවැනි ආක්‍රමනශීලි යුද්ධයක් දියත් කිරීම යි.

කෙරී එවැනි නිගමනයකට පැමිනෙන්නේ හෝ එවැනි සැසඳීමක් කරන්නේ හෝ නැත. ඊට හාත්පසින්ම වෙනස් ආකාරයකට, වඩාත් ඵලදායී අන්දමට තමාට යුද්ධය මෙහෙයවිය හැකි බවට ඔහු විවේචනය ඉදිරිපත් කරයි. "මා කථා කරන්නේ ඉරාකයෙන් ඉවත්වීම ගැන නොව, මා කථා කරන්නේ එහි යුද්ධයෙන් ජය ගැනීම ගැනය" යි බුෂ් සමග විවාදයක දී ඔහු පැවසී ය. තමා ජනාධිපතිවරනය ජයග්‍රහනය කලොත් ඉන් පසු එලඹෙන තම වර්ෂ හතරක පාලන කාලය පුරාම එක්සත් ජනපද භටකායන් ඉරාකය තුල දිගටම රැඳී සිටිනු ඇතැයි කෙරී අඟවා ඇත. ඒ සමගම, එක්සත් ජනපද යුද හමුදාවට තවත් 40,000ක භටකායක් එකතු කිරීමටත් යුද හමුදාවේ ප්‍රමුඛ ඝාතක කන්ඩායම් වන එක්සත් ජනපද විශේෂ බලකායන් සංඛ්‍යාවෙන් දෙගුන කිරීමටත් පක්ෂව ඔහු කතා කොට ඇත.

"අසාර්ථකත්වය විකල්පයක් නොවේ ය" යන්න ඉරාකය සම්බන්ධයෙන් කෙරීගේ ප්‍රියතම සටන් පාඨයකි. අපි ද එයට එකඟ වෙමු: අසාර්ථකත්වය

විකල්පයක් නොවේ; එය නොවැලැක්විය හැක්කකි. එය ඉක්මන් වන තරමට, වඩාත් යහපත්ය. එක්සත් ජනපදයෙහි හා ජාත්‍යන්තරව කම්කරු පන්තියට අහිතකරම ප්‍රතිඵලය වනුයේ ඉරාකයෙහි එක්සත් ජනපද පාලනය තහවුරු වීමයි. එවැනි සාර්ථකත්වයක් මං පාදනු ඇත්තේ වඩාත් ලේවැකි ආක්‍රමනයන්ට හා අවසානයේ දී තවත් ලෝක යුද්ධයකට ය.

සමාජවාදී සමානතා පක්ෂය මෙම යුද්ධයට එරෙහි ව්‍යායාමයක අප්‍රතිහතව නිරතව ඇත. ක්ෂනිකව හා කොන්දේසි රහිතව සියලු එක්සත් ජනපද භටකායන් ආපසු ගෙන්වා ගත යුතු යයි ඉල්ලා ඇත්තේ අප අපේක්ෂකයින් පමනි.

අප පක්ෂයේ අපේක්ෂකයින් ඡන්ද අපේක්ෂක නාමාවලියට ඇතුලත් කර ගැනීම සඳහා අප සටන් කල සෑම ප්‍රාන්තයකම මෙම ඉල්ලීමට බලගතු සහායක් ලැබුනි. අවශ්‍ය වන අත්සන් දස දහස් ගනන් එකතු කර ගැනීමේ ක්‍රියාවලිය තුල, මෙම යුද්ධය අවසන් කිරීමට තමන්ට අවශ්‍ය බවටත්, එහෙයින් අපට සහාය වන බවටත්, ඉරාකයෙහි සිටින යුදභටයින්ගේ නෑදෑයෝ අප වෙත ප්‍රකාශ කොට ඇත.

භටකායන් ආපසු ගෙන්වා ගැනීමට එක්සත් ජනපද ජනගහනයෙන් අඩක් පමන කැමැත්ත දක්වන බවට ඇතැම් මත විමසුම් පෙන්නුම් කොට ඇත. මේ අතර වාරයේ, මහා ව්‍යාපාර නියෝජනය කරන පක්ෂ දෙකෙන් කුමන පක්ෂයක හෝ එකදු ප්‍රමුඛ පෙලේ දේශාපලනඥයෙකු හෝ ජන මාධ්‍ය තුල හඬක් හෝ එවැනි යෝජනාවක් ඉදිරිපත් කර නැත. යුද්ධයට එරෙහිව මේ පුලුල් ලෙස පැතිර ඇති විරෝධය ඇමරිකාවෙහි පවතින ද්විපාක්ෂික පද්ධතිය තුල ප්‍රකාශනය නොවීම වර්තමාන මැතිවරනයෙහි අරුත්බර අංගයකි.

අප ඡන්ද ව්‍යායාමයේ නිර්වචන සෑම තැනකම මෙම දේශපාලන පද්ධතිය පිලිබඳ ඉච්ඡා භංගත්වයක ගැඹුරු හැඟුමක් අප අභිමුඛයට එයි - එනම්, අති විශාල ජනකායකගේ අදහස් දේශපාලන පද්ධතිය මගින් ක්‍රමානුකූලව බැහැර කිරීම හා සෑම ප්‍රශ්නයක් මතම පාහේ අතිමූලිකව එකඟවන පක්ෂ දෙකක ඇඩි ආධිපත්‍යයයි.

මිලියන 20ක ජනගහනයක් පමනක් ඇති ශ්‍රී ලංකාවෙහි දුසිමකට ආසන්න දේශපාලන පක්ෂ සංඛ්‍යාවක් පාර්ලිමේන්තුවෙහි නියෝජනය වී ඇත යන කරුන සැලකිල්ලට ගැනීම වටී; එනමුදු, මිලියන 300ක ජනගහනයක් ඇති ඇමරිකාවෙහි නියෝජනය වන්නේ පක්ෂ දෙකක් පමනි.

මෙහි විපාකය වන්නේ දේශපාලන ක්‍රියාවලිය සම්බන්ධයෙන් ගැඹුරට දිව යන විගලිතභාවයකි. 2000 වසරේ දී, ඡන්දය පාවිච්චි කිරීමට ඉදිරිපත් වූයේ ඒ සඳහා සුදුසුකම් ඇත්තවුන්ගෙන් යන්තමින් සියයට 50ක ප්‍රතිශතයකි. ඕනෑම රටක සමාජමය හා දේශපාලනමය සෞඛ්‍යයෙහි මිනුම් දන්ඩක් වන මැතිවරන තුල ජනතා සහභාගිත්වය අතින් සලකා බලන කල ලෝකයේ රටවල් අතුරින් ඇමරිකාවට අත්වන්නේ පිලිවෙලින් 136 ස්ථානය යි. ඒ දුප්පත්කමින් පෙලෙන අප්‍රිකානු රාජ්‍යයන් දෙකක් වන චාඩ් රාජ්‍යයට හා බොස්නියාවට අතරමැදි ස්ථානය යි.

2000 වසරේ දී, ඡන්දය පාවිච්චි කල සියයට 50ක ප්‍රතිශතය අතුරින් අඩකට සුලු වසයෙන් අඩු ප්‍රමානයක් බුෂ්ට ඡන්දය දුනි. පොදු ජන ඡන්දය අහිමි වූ අපේක්ෂකයාගේ විජයග්‍රහනය දැන් එක්සත් ජනපද දේශපාලන පද්ධතියෙහි අපකීර්තිමත් අංගයකි. එය 2004 වසරේ මැතිවරනයෙහි දී ද යලි සිදුවිය හැක්කකි.

2000 මැතිවරනයෙහි දී, සිය ජනාධිපතිට ඡන්දය දීමේ ව්‍යවස්ථානුකූල අයිතියක් ඇමරිකානු ජනතාව සතුව නැත යන නිශ්චිත ප්‍රකාශයක් මෙම පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා එක්සත් ජනපද ශ්‍රේෂ්ඨාධිකරනය මගින් 2002 වසරේ දී පනවන ලදි. ප්‍රාන්ත ව්‍යවස්ථාදායකයන්ට ඡන්දදායකයන් වෙනුවෙන් තීරනය ගත හැකි ය යන ප්‍රකාශනය තීන්දු කරන ලදි. අප ඒ අවස්ථාවේ දී කියා සිටි පරිදි, මැතිවරනයක් විවෘතව කොල්ලකෑමට එරෙහිව ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කිරීමට එක්සත් ජනපද දේශපාලන සංස්ථාපිතයෙහි කිසිදු වැදගත් කොටසක් අපොහොසත් වීම, ඇමරිකානු දේශපාලන ඉතිහාසයෙහි සන්ධිස්ථානයක් සලකුනු කලේ ය.

මෙහි ප්‍රතිඵලය වනුයේ වසර තුනහමාරක කාල පරාසයක් තුල, ආක්‍රමනශීලි යුද්ධ දෙකක් මෙහෙය වූ ආන්ඩුවක් පිහිටුවීම ය. එය එක්සත් ජනපද ඉතිහාසය තුල සිවිල් නිදහස අරබයා වඩාත්ම පුලුල් පරාසයකින් යුතු ප්‍රහාර ක්‍රියාත්මක කල ආන්ඩුවකි. එය, චෝදනා, නඩු ඇසීම්, නඩු විභාග හෝ නීතිඥ සහාය ලබාගැනීම් නොමැතිව පුරවැසියන් මෙන් ම පුරවැසියන් නො වන අය ද සිරකර තැබීමේ අයිතිය තමන් වෙත පවරා ගැනීම එම ප්‍රහාරවලට ඇතුලත් වේ. එසේ කරනුයේ ඒ අය "පසමිතුරු සටන්කරුවන්" බවට හුදෙක් එක්සත් ජනපද ජනාධිපති විසින් කරන ලද නිගමනයක් මත ය - ජාත්‍යන්තර නීතිය යටතේ "පසමිතුරු සටන්කරුවන්" යන යෙදුමෙහි කිසිදු අරුතක් නොමැත.

මේ ආන්ඩුව ඉස්ලාමීය, අරාබි හා දකුනු ආසියාතික රටවලින් පැමිනි සංක්‍රමනික කම්කරුවන්ට එරෙහිව රුදුරු දඩයමක් ක්‍රියාත්මක කර ඇත. සාක්ෂි මත පදනම්වීමෙන් තොරව මේ සංක්‍රමනික කම්කරුවන් දහස් ගනන් අත්අඩංගුවට ගෙන ඇත. සුලු සංක්‍රමනික වැරදි යොදා ගෙන ඇතැමුන් දිගු කල් රඳවාගෙන ඇත; අනිකුත් අයව රඳවාගෙන ඇත්තේ හුදු මාර්ග නීති උල්ලංඝනය කිරීම් වැනි සුලු වැරදිවලට ය. බොහෝ අවස්ථාවල ඔවුන් හය මසකට හෝ ඊට වැඩි කාලයකට සිරගත කොට ඇත. එසේ කර ඇත්තේ එලිපිටම නීති විරෝධීව ය. ඔවුන් තම රටවලට ආපසු පිටත් කර යැවීමට පෙර සිරගෙවල් තුල කුරිරු පහරදීම්වලට ලක් කරනු ලැබූහ.

මේ වධහිංසා කිරීම් රැල්ල එලිදරව් කර එය හෙලා

දැකීමටත් සංක්‍රමනික කම්කරුවන් ආරක්ෂා කිරීමටත් අප පක්ෂය ක්‍රියා කර ඇත. එසේ කරන අතර, අද දින සංක්‍රමනිකයන් ලක් කෙරෙන හිංසන හෙට දින සමස්ත කම්කරු පන්තිය මත පැටවෙන බවට ද අප අනතුරු අඟවා ඇත. සැබවින් ම, දැනටමත් ඇමරිකානු පුරවැසියන් දෙදෙනෙකු පසමිතුරු සටන්කරුවන් මෙන් හුදෙකලා හිර අඩස්සියෙහි රඳවා ගෙන ඇත.

මැතිවරනය සොරා ගැනීම යොදාගෙන බහුතරයට අවාසිදායක වන අන්දමටත් ජනගහනයෙන් ධනවත්ම සියයට එකක ප්‍රතිශතයට වාසිදායක වන අන්දමටත් කිසිදු හිරිකිතයක් නොමැතිව ක්‍රියාත්මක වන ආන්ඩුවක් ද නිර්මානය වී ඇත. එය වනාහී පොහොසතුන් විසින් පොහොසතුන් සඳහා ද, ක්‍රියාත්මක වන පොහොසතුන්ගේ ආන්ඩුවකි. එම ආන්ඩුව වැඩ කරන ජනතාවගේ අති විශාල බහුතරය ධනේශ්වර "නිදහස් වෙලඳ පොලෙහි" මංකොල්ලයට ලක් කරන අතර බැංකු, සංගත හා ධනවත් ප්‍රභූව වෙනුවෙන් එක්තරා ආකාරයක සුභසාධනයක් සලසයි.

ජනාධිපතිවරනය සඳහා අපේක්ෂකයින් තෝරා ගැනීමෙහි දී පවා, එක්සත් ජනපද මූල්‍යමය කතිපයාධිපත්‍යයෙහි අයෝමය ග්‍රහනය පැහැදිලිව පෙනේ. ඩිමොක්‍රැටික් පාක්ෂික කෙරී රටෙහි විශාලම පවුල් සම්පතකට හිමිකම් කියයි. එහි එලිදරව් කරන ලද වටිනාකම ඩොලර් බිලියන 750කට අධික ය. එයට සාපේක්ෂව, බුෂ් දුප්පතෙකි. ඔහුට අයත් වත්කම්වල අගය ඩොලර් මිලියන 18ක් පමනි. එකම මූල්‍යමය ආයතන පක්ෂ දෙකෙහිම මැතිවරන ව්‍යාපාරවලට අරමුදල් සපයති. කෙරී හා බුෂ් යන දෙදෙනාටම මුදල් ප්‍රදානය කරන ඉහලම පෙලේ ව්‍යාපාර 10 අතර එක්සත් ජනපදයෙහි විශාලතම මූල්‍යමය ආයතන හතරක් වෙති; එනම්, සිටිග්‍රෘප්, ගෝල්ඩ්මන් සැක්ස්, මෝර්ගන් ස්ටැන්ලි හා සංස්ථාපිත යූබීඑස්-ඒජී යන ආයතන යි.

## එක්සත් ජනපදය තුල සමාජ ධ්‍රැවීකරනය

මෙවන් පුද්ගලයන් තෝරා ගැනීම ද ඔවුන් දෙදෙනා ම එකම වෝල් වීදි මූල්‍යාධිකාරීන් විසින් ආධාර කිරීම ද ඇමරිකාව තුල පසුගිය දශක දෙක තුල අඛන්ඩව වර්ධනය වී ආ තීව්‍ර සමාජ ධ්‍රැවීකරනයේ දේශපාලන පිලිබිඹුවකි. මහා අවපාතයේ මුවවිට දී 1929 දී ආන්ඩුව වාර්තා තැබීම පටන්ගත් තැන් පටන් බැලුවහොත් මහ සංගතවල ලාභය ජාතික ආර්ථිකයේ වැඩිම පංගුවක් අත්කර ගන්නේ දැන් වන අතර කම්කරුවෙකුගේ ශුද්ධ වැටුප අඩුම මට්ටමට වැටී ඇත්තේ ද දැන් ය.

*ෆෝබ්ස්* සඟරාව මෙම වර්ෂයේ පොහොසත් ඇමරිකානුවන් 400 ලැයිස්තුගත කරද්දී සටහන් කල පරිදි මෙම වරප්‍රසාදිත කන්ඩායම දැන් තනිකර ම පාහේ බිලියනපතියන්ගේ සමාජයක් බවට පත්ව තිබේ. එයට අයත් සෑම එකකුම ඩොලර් මිලියන 750කට වැඩි ආදායමක් ලබයි. ඔවුන්ගේ දේපලෙහි ඓක්‍යය කැනඩාවේ සමස්ත දල ජාතික නිෂ්පාදනයට ටිකක් වැඩි ය.

මේ අතර මිලියන 40ක් ඇමරිකානුවෝ දරිද්‍රතා කඩඉමෙන් පල්ලෙහා ජීවත් වෙති. ඒ වනාහි ඇමරිකානු ශ්‍රම බලකායෙන් හතරෙන් පංගුවක් තරම් ප්‍රමානයකි. ජනගහනයේ මෙම කොටස අන් සියලු කොටස්වලට වැඩි වේගයකින් වැඩී එයි.

බුෂ් පාලනය යටතේ රැකියා මිලියන 1.6ක් (16 ලක්ෂයක්) අතුගා දමා ඇත. දිගුකාලීන විරැකියා සංඛ්‍යාව, එනම් විරැකියනට ලැබෙන සියලු සහන කැපෙන තරම් දිගු කලක් රැකියාවක් සොයා ගැනීමට නො හැකි වී සිටින්නන්ගේ සංඛ්‍යාව දෙගුන වී තිබේ. ආන්ඩුව "අධෛර්යයට පත් කම්කරුවන්" යයි නම් කරන කොටස, එනම් හොඳ, සැලකිය යුතු වැටුපක් ලැබෙන රැකියාවන් නොමැති තතු තුල ඒවා සෙවීම මුලුමනින් ම අතහැර දමා සිටින සංඛ්‍යාව සියයට 60කින් ඉහල නැග තිබේ.

පසුගිය අවුරුදු කිහිපය තුල ඇති කරනු ලැබූ රැකියාවලින් ලැබෙන වැටුප විනාශ කරන ලද රැකියාවලින් ලැබෙන වැටුපට වඩා බෙහෙවින් අඩු ය. අලුතෙන් ඇති කරනු ලැබූ රැකියාවලින් සියයට 90ක් ම අඩු වැටුප් අංශ වල ය. ඉන් තුනෙන් පංගුවක් ම ගොඩනැගිලි බලා කියා ගන්නන්, තාවකාලික කම්කරුවන් සහ ෆාස්ට්-ෆුඩ් කම්කරුවන් ය. තවත් මිලියන 45ක් පොදු සෞඛ්‍ය සේවා පද්ධතිය නැත්තටම නැති කර ඇති ඇමරිකාවේ අත්‍යවශ්‍ය වූ පෞද්ගලික සෞඛ්‍ය රක්ෂනයට අහිමිවූවෝ ය.

මේ අංශයෙන් වුව ඩිමොක්‍රැටික් පක්ෂය බුෂ්ට විකල්පයක් නො වේ. කෙරී කඳවුර විසින් පොරොන්දු දී තිබෙන සෞඛ්‍ය ආරක්ෂන, අධ්‍යාපන සහ වෙනත් ප්‍රතිසංස්කරන මායාවල් පමනි. දැනටම ඩොලර් බිලියන 400ක් වන පිම්බෙන රාජ්‍ය මූල්‍ය හිඟය අවුරුදු 4ක් ඇතුලත හරි අඩකින් කැපීමට දෙන ලද පොරොන්දුවක් මත ඩිමොක්‍රැටික් පක්ෂය පදනම්ව සිටී. මෑත දී පැවැත්වුනු විවාදයක දී ඩිමොක්‍රැටික් පක්ෂයේ උප ජනාධිපති අපේක්ෂකයා තම පොරොන්දුවලින් කොයි එකක් හෝ අයවැය හිඟය කැපීමට බාධාවක් බවට පත් වුවහොත් එය අතහැර දමන බව ප්‍රකාශ කලේ ය.

එක්සත් ජනපදයේ - එපමනක් නො ව මුලු ලෝකයේ ම - වැඩ කරන ජනයාට වධ දෙන ඉමහත් ප්‍රශ්නවලින් කුමක් වුව ද විසඳාලිය හැක්කේ - ප්‍රධාන වශයෙන් ම එක්සත් ජනපද මූල්‍ය ප්‍රභූව විසින් දැවැන්ත ධනයක් කඳු ගසා ගැනීම ද භූගෝලීය ආර්ථිකය සිය මූල්‍ය ආවශ්‍යකතාවන්ට යටත් කිරීම ද හේතු කොට ගන්නා වූ සමාජ අසමානතාවයට කෙලින්ම මුහුන දීමෙන්ම පමනි. සමාජය විප්ලවකාරී සමාජවාදී පරිවර්තනයක් සඳහා වූ ක්‍රියාමාර්ගයකින් සන්නද්ධ වූ කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් උදෙසා අප සටන් කරන්නේ ඒ හෙයිනි.

එක්ව ගත් කල්හි මිලියන 30ක් ජනයාගෙන් යුක්ත වූ ප්‍රාන්ත රාජ්‍ය අටක ඡන්ද පත්‍රිකාවලට අපගේ අපේක්ෂකයන්ගේ නම් ඇතුලත් කර ගනිමින් අපි අර්ථභාරී සහයෝගයක් දිනාගෙන සිටිමු. මුල පටන් ම

මෙම ඡන්ද විමසීමේ දී ලැබෙන්නට යන ඡන්ද සංඛ්‍යාව ගැන අප යථාර්ථවාදී ය යන්න අවධාරනය කර ඇත්තෙමු. මහා සංගතයන් විසින් පාලිත මාධ්‍යයෝ රිපබ්ලිකානුවන් සහ ඩිමොක්‍රැටිකයන් හැර අන් කුමන අපේක්ෂකයෙක් වුව දැඩි සේ බැහැර කරති. විශේෂයෙන් ම මහා ජාවාරම්කරුවන්ගේ පක්ෂ දෙකම යෝධ දැන්වීම් ව්‍යායාම මගින් දේශපාලන වාතාවරනය විෂ කිරීමට වියදම් කරන්නා වූ ඩොලර් බිලියන ගනන් හා සසඳා බලන කල්හි අපට ඇත්තේ සීමිත මූල්‍ය සම්පත් ය.

එසේ වුව ද මේ පක්ෂ දෙක අපේ මැතිවරන ව්‍යායාමය දරුනු සේ බැරෑරුම් ව ගනන් ගනිති. විශේෂයෙන් ම ඩිමොක්‍රැටිකයෝ ඇමරිකාව තුල සැබෑ සමාජවාදී විකල්පයක් පැනනැගීම පසෙක තිබියේවා, වමෙන් එන කුමන අභියෝගයකට වුව අතිශයින් ම සංවේදී වන්නාහ.

ඉලිනොයිහි අප සහෝදර ටොම් මැකමන්ගේ ව්‍යායාමය මේ පිලිබඳ අධ්‍යාපනීය උදාහරනයකි. ඔහු තරග කරන්නේ රාජ්‍ය නියෝජිත තනතුරට ය. එය ප්‍රාරම්භක තරාතිරමේ දේශපාලන නිලයක් යයි විස්තර කල හැකි තනතුරකි. මැකමන් තරග වදින්නේ දැනට සිටින ඩිමොක්‍රැටික් පාක්ෂික නියෝජිතයාට විරුද්ධව ය. මෙයට ප්‍රතිචාර වශයෙන් මැකමන් ව ඡන්දාපේක්ෂක ලැයිස්තුවෙන් ඉවත් කිරීම සඳහා මහා පරිමාන ප්‍රයත්නයක යෙදී ගත් ඩිමොක්‍රැටික් පක්ෂය අපගේ ආධාරක (ඡන්දාපේක්ෂකයෙකුගේ නම අපේක්ෂක නාම ලැයිස්තුවට ඇතුලත් කිරීම සඳහා ඉල්ලන) පෙත්සම්වල අත්සන් ප්‍රශ්නයට භාජන කිරීම සඳහා අගනුවර සිට රාජ්‍ය නිලධාරීන් එවී ය.

අපගේ පක්ෂයේ අපේක්ෂකයාගේ නම ඡන්ද පත්‍රිකාවට ඇතුලත් කරන ලෙස ඉල්ලන පෙත්සම්වල අත්සන් සියගනනකට ඔව්හු අභියෝග කලහ. මෙම අභියෝග ලිපි ලබන කාර්යාලයක ලේකම්වරියක් ඉන් එක් අත්සනක් තමාගේ යයි කියා සිටි පසු ද ඩිමොක්‍රැටික් පාක්ෂික නිලධාරියා තමා එය ගනන් ගන්නේ නැති බව ද, කොහොම වුවත් එම අත්සනට ද තම අභියෝගය ඉදිරිපත් කරන බව ද කියා සිටියේ ය. ඉලිනොයිහි ඡන්දදායකයන්ගේ ද ලොව පුරා ජාත්‍යන්තර සහයෝගයේ ද ආධාරයෙන් අපි මෙම අභියෝගය ජය ගතිමු. එහෙත් අපි, මෙම අවුරුද්දේ ජනාධිපති තරගයේ ඉතා දැඩි සේ තරගයට ලක් වූ ප්‍රාන්ත රාජ්‍ය එකක් වන ඔහයෝ ප්‍රාන්තයේ දී අපගේ අපේක්ෂකයා ඉවත් කර දැමීමට දැරෙන එවන් දුර්යත්නයකට එරෙහිව දැනුදු සටන් කරමින් සිටිමු.

මෙම ප්‍රචන්ඩ විරුද්ධත්වය අපට පෙන්නුම් කරන්නේ ඉදිරියේ දී එන්නට තිබෙන දේ ය. පාලක පන්තිය තමන්ගේ ම දේශපාලන පද්ධතිය ගැන විශ්වාස භංග කර ගනිමින් සිටී. තමන්ගේ දෙපා යටින් පොලොව විවර වන බව දැන සිටින එම පන්තිය දේශපාලන විකල්පයක් ඉස්මතුවීම වැලැක්වීමට වියරු ප්‍රයත්නයක යෙදී සිටී.

ඇමරිකාවේ ඊනියා 'වමෙන් ද' අපේ ව්‍යායාමයට විරුද්ධත්වය එල්ල වී තිබේ. "මොව්හු බුෂ් ඇර වෙන ඕනෑම කෙනෙක්" ගැන බියගුලු සටන්පාඨය යටතේ ඩිමොක්‍රැටිකයන්ට හා කෙරීට යටත්ව සිටිති. නොවැම්බර් 2 දින ඩිමොක්‍රැටික් ජයග්‍රහනයක් සහතික කිරීම සඳහා සෑම සියලු දේශපාලන ප්‍රශ්නයක්ම ඉවතට දැමිය යුතු යයි ඔව්හු කියා සිටිති. මේ 'වම්මු' එකෙක් වත් කෙරීගේ ක්‍රියාමාර්ගය බරපතල විග්‍රහයකට භාජන නොකරති. ඔහු බලයට පත් වූ කල්හි දුක අඩුවන්නේ කාට ද? ඔහුගේ තේරී පත්වීම ඉරාකය හා ඇෆ්ගනිස්ථානයේ එක්සත් ජනපද ආක්‍රමනය අවසාන කරයි ද? මෙයට ප්‍රතිකූලව, මේ රටවල්වල ඉන්නා ඊනියා "ත්‍රස්තවාදීන්" අභිබවා ජයග්‍රහනය කිරීමට කෙරීම සපථ කර සිටී.

කෙරීගේ ජයග්‍රහනයක් ඊස්රායලයට දෙන එක්සත් ජනපද සහාය නිම කරලයි ද? ෂැරොන් ආන්ඩුව පලස්තීන ජනයාට එරෙහිව එල්ල කරන්නට තීන්දු කරන මොන ජාතියක හෝ ප්‍රචන්ඩත්වයකට කොන්දේසි විරහිතව සහාය දෙන බව කෙරී ප්‍රකාශ කර සිටී.

විරැකියනට රැකියා හෝ වැඩ කරන ජනතාවට වඩා හොඳ ජීවන තත්වයක් සහතික වේ ද? එවැනි දියුනුවක් අපේක්ෂා කිරීමට හේතු ඇත්තේ ද නැත.

කෙරී ජනාධිපති ලෙස තෝරා පත් කර ගනු ලැබුවොත් බොහෝ දුරට එසේ වනු ඇත්තේ බුෂ් පාලනාධිකාරය උවමනාවට වඩා අපකීර්තියට පත් ව ඇතැ යි ද, යුද්ධය වඩා හොඳට කර ගෙන යාම සඳහා සහ කම්කරු පන්තියට එරෙහිව තම ප්‍රතිගාමී පිලිවෙතේ ක්‍රියාත්මක කිරීම සඳහා අලුත් මිනිහෙක් අතට සුක්කානම දිය යුතු යයි ද පාලක ප්‍රභූවට දැනී ගොස් ඇති නිසා ය.

එක්සත් ජනපදයේ යුද හමුදා ඉරාකයේ මුහුන දී සිටුනා අර්බුදය සැලකිල්ලට ගත් කල්හි බලෙන් හමුදාවට බඳවා ගැනීම ක්‍රියාත්මක කිරීමට බරපතල ලෙස සිතා බැලෙන බව හඟවන ලකුනු වැඩෙමින් පවතී. මහජනයාට පුලුල්ව එපා වූ එවන් පියවරක් ගන්නවා නම්, තමා වියට්නාම් යුද්ධයේ කෘතහස්තයෙකු යයි ආඩම්බර වන කෙරී, බුෂ්ට වඩා එය ක්‍රියාත්මක කිරීමට සුදුස්සෙකු ලෙස සැලකෙනු ඇත.

අවසානයේ දී ඊනියා "වම්මුන්ගේ" තර්ක හුදෙක් තහවුරු කරන්නේ ඔවුන්ගේ දේශපාලනය තනිකරම ද්වි-පක්ෂ ක්‍රමයේ ද ධනවාදයේ ද රාමුව තුලට සීමා වී පවත්නා බව ය. ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ප්‍රතිසතිකාවන් අධිරාජ්‍යවාදයට වඩා බලගතු බව වටහා ගැනීමට අසමත් වන ඔව්හු ඇමරිකානු කම්කරු පන්තියේ විප්ලවවාදී භූමිකාව විද්‍යාත්මක වටහා ගැනීම ප්‍රතික්ෂේප කරති. ඇමරිකානු කම්කරුවන්ගේ අරගලයන් අද දින විකසිත වන්නේ දැවැන්ත ලෙස වර්ධනය වූ ද භූගෝලීය නිෂ්පාදන සන්තතියක් තුල වෛෂයිකව ඒකාබද්ධ වූ ද ජාත්‍යන්තර කම්කරු පන්තියක අත්‍යන්ත කොටසක් ලෙස ය යන්න දැක

ගැනීමට ඔව්හු අසමත් වෙති. පාලක ප්‍රභූවේ වඩාත් දැනුවත් නියෝජකයෝ, එම පද්ධතියට විරුද්ධ වන්නන් ලෙස කියාපාගන්නා වම්මුන්ට වඩා බෙහෙවින් තමන්ගේ පද්ධතිය පිලිබඳ විශ්වාසය හීන කරගෙන සිටිති.

මෙම පද්ධතිය අර්බුදයන් ගනනාවක සම්පතනයට මුහුන දී සිටී. එක්සත් ජනපදයේ ප්‍රවර්තන ගිනුම් හිඟය වාර්ෂිකව ඩොලර් බිලියන 600 ඉක්මවා ඉහල නැග තිබේ. ඒක-පාක්ෂික-වාදය සහ ජාත්‍යන්තර මහ ජන මතය නොතැකීම බුෂ් පරිපාලනය විසින් දිගින් දිගටම පවත්වාගෙන යන්නේ එක්සත් ජනපද ආර්ථිකය සිය හිඟයන් පියවා ගැනීම සඳහා දිනකට ඩොලර් බිලියන 2ක් විදේශ ප්‍රාග්ධනය ලබා ගැනීම මත රැඳී පවත්නා තතු තුල ය. අද දින ඇමරිකාව ඩොලර් වටිනාකම වශයෙන් ගතහොත් අපනයනයන් මෙන් දෙගුනයක් ආනයනය කරමින් සිටී. මෙම මහා අසමතුලිතතාවන් දිගින් දිගටම පවත්වා ගෙන යා නො හැකි ය. දැවැන්ත ලෙස අස්ථායීකාරක වූ ලෝක ආර්ථික අර්බුදයක් සඳහා ද ලෝක ධනවාදයේ කේන්ද්‍රය වූ ඇමරිකාව ද ඇතුලුව ජාත්‍යන්තරව විප්ලවවාදී අරගලවල නව රැල්ලක් සඳහා ද තත්වයන් පැනනගිමින් පවතී.

එක්සත් ජනපදය ඉමහත් ධනය හා දේශපාලන බලය දරා සිටින රටවල් ලෙස ලංකාව සහ වෙනත් ඊනියා සංවර්ධනය වෙමින් පවතින රටවල් තුල ප්‍රචලිත ව පවතී. විදේශවලට ආනයනය කරනු ලබන රූපවාහිනී වැඩ සටහන් ඇමරිකාව සමාජ ප්‍රශ්න ඉතා අඩු වූ ජනකායකින් යුතු රටක් ලෙස මවා පෙන්වයි. ඒවා දිලිඳුකම, විරැකියාව, සහ නය බර දස ලක්ෂ ගනන් ඇමරිකානුවන් තාඩනය කරන්නා වූ යථාර්ථය ලෙස පවතිනා බව වසන් කරති.

## ඇමරිකාවේ විප්ලවීය සම්ප්‍රදායයෝ

පිටරටවල ඇමරිකාව පිලිබඳ ප්‍රචලිත විචිත්‍ර විස්තරය එක්සත් ජනපද ඉතිහාසය ද වසන් කරයි. එක්සත් ජනපද ආන්ඩුව මගින් මෙහෙයවන ලද ආක්‍රමනශීලි යුද්ධ, භූගෝලීය යුදවාදය හා දේශපාලනමය මර්දනය අද දින එක්සත් ජනපදයෙහි පවත්නා තියුනු සමාජමය අසමානතා ඇමරිකාවෙහි ම ප්‍රගාඪ ඓතිහාසික සම්ප්‍රදායන්ට සෘජුවම පරස්පරවිරෝධී වේ.

මේ වර්ෂය කැන්සාස්-නෙබ්‍රස්කා පනතෙහි 150 වැනි සංවත්සරය සලකුනු කරයි. එම පනත එක්සත් ජනපද සෙනෙට් සභාව විසින් සම්මත කර ගන්නා ලද ප්‍රතිගාමී විධිවිධානයක් විය. එමගින් බටහිර ඇමරිකාවේ නව ප්‍රදේශයන් වහල් ක්‍රමය සඳහා විවෘත කෙරින. එය රටෙන් සෑහෙන කොටසක් රැඩිකලීකරනයට යොමු කල ක්‍රියාමාර්ගයක් විය. ඒ හේතුවෙන්, වහල් භාවය අහෝසි කිරීම වෙනුවෙන් දිවි පිදූවෙකු වන ජෝන් බ්‍රවුන් ද ඇතුලුව, "නිදහස්" පදිංචිකරුවන් කැන්සාස් ප්‍රාන්තය වෙත ගංවතුරක් සේ ගලායාම සැලසුනි. එහි දී ඔවුහු වහල්භාවයට පක්ෂ කොටස්වලට එරෙහිව ලේවැකි ගරිල්ලා යුද්ධයක නිරත වූහ. එම පනත ඒබ්‍රහම් ලින්කන් ජාතික දේශපාලන තලයට තල්ලු කිරීමට ද හේතුකාරක විය. එමගින් රිපබ්ලිකන් පක්ෂය ස්ථාපිත කිරීමටත් ඇමරිකානු සිවිල් යුද්ධයට මග පෑදූ දක්ෂින ප්‍රාන්තයන්ගේ බිඳී වෙන්වීමටත් මං පෑදුනි.

මෙම යුද්ධයේ ප්‍රගතිය දෙස කාල් මාක්ස් තියුනු උනන්දුවකින් බලා සිටියේ ය. එම අරගලය වහල් කතිපයාධිපත්‍යයට එරෙහි "ලොව පරිවර්තනයට ලක් කරන විප්ලවීය ව්‍යාපාරයක්" ලෙස ඔහු හැඳින්වී ය. ඔහු එය ජාත්‍යන්තර කම්කරු පන්තිය මගින් දියත් කරන දේශපාලන ප්‍රහාරයක පෙර නිමිත්තක් වනු ඇතැයි නිවැරදි අනාවැකියක් පල කලේ ය.

රටෙහි තුනෙන් පංගුවක් තුල, ප්‍රධානතම දේපල ස්වරූපය වන්දි ගෙවීමකින් තොරව පවරා ගැනීමක් වූ කලු ජාතික වහලුන් දස ලක්ෂ හතරක් මුදවාලීම ඉන් ඉටු කෙරිනි - අද දින ව්‍යවහාර මුදලින්, මේ මානව ප්‍රාග්ධනයෙහි අගය ඩොලර් ට්‍රිලියන් 3ක් වනු ඇත.

පලමුවැනි ඇමරිකානු විප්ලවයෙහි සිට නොවිසඳී පැවතුනු විසංවාදයන් මත මේ යුද්ධය රැඳුනි. "සියලු මිනිසුන් එක හා සමානව උපත ලබා ඇත" හා සෑම මිනිසෙකුට ම "ජීවත්වීමේ නිදහසේ හා තෘප්තිය සොයා යෑමේ" අයිතිය උරුම වී ඇත යන්න, පලමුවැනි ඇමරිකානු විප්ලවය ගෙන යෑමට පදනම් වූ 1776 වසරේ දී පල කරන ලද ලියවිල්ල වන ස්වාධීනතා ප්‍රකාශනය තුලින් තහවුරු කරන ලදි. එනමුදු, දකුනු ප්‍රාන්තවල වහල් හිමියන්ට නම්, සමානතාවය සුදු ජාතිකයන්ට පමනක් සීමා වූවක් විය. ඔවුන්ට නම්, "තෘප්තිය සොයායෑම" යන්න වෙනත් මිනිසුන් අයිති කර ගැනීම ද ඇතුලත් කර ගති.

සිවිල් යුද්ධයට දෙවසරකට පෙරාතුව ලින්කන්, වහල් භාවයට පක්ෂපාතී ඩිමොක්‍රැටික් පක්ෂය හෙලා දුටුවේ ය. එම පක්ෂයෙහි ආරම්භකයා වූ ස්වාධීනතා ප්‍රකාශනයේ ප්‍රධාන කතෘවරුන්ගෙන් එක් අයෙකු වන තෝමස් ජෙෆර්සන් සමග එම පක්ෂයට මොනම සබඳකමක් වත් නැති වී තිබෙන බව ලින්කන් පෙන්නුම් කලේ ය. ඊට මුලුමනින් ම ප්‍රතිකූලව එම පක්ෂය, "එක් මිනිසකුගේ නිදහස වෙනත් කෙනෙකුගේ දේපල අයිතිය සමග ගැටෙන විට පරම වශයෙන්ම ශූන්‍යයක් බවට පත් වෙතැයි" විශ්වාස කරන පක්ෂයක් බවට ඩිමොක්‍රැටික් පක්ෂය පත්ව ඇතැයි ලින්කන් පෙන්වා දුනි.

වහලා තවෙකකුගේ දේපල ලෙස සැලකීම සිවිල් යුද්ධය විසින් අවසන් කර දමනු ලැබිනි. එහෙත් එක්සත් ජනපද ඉතිහාසය පුරා ද ලෝක ඉතිහාසය පුරා ද පොදු හුයපටක් සේ දිවයන්නා වූ නිදහස හා දේපල අතර සාරභූත විසංවාදය විසඳාලීමට සිවිල් යුද්ධය කිසිසේත් ම සමත් වූයේ නැත.

මේ ගැටුම 19 වැනි සියවසේ අවසාන භාගයේ සිට, ප්‍රාග්ධනය හා ශ්‍රමය අතර අරගලයක ස්වරූපය ගෙන ඇත. එක්සත් ජනපදය තුල, මෙම අරගල සන්නද්ධ කැරලිකාරී ප්‍රචන්ඩත්වය හා සිවිල් යුද්ධයන්ට ආසන්න තත්වයන් හා බැඳී පැවතී තිබේ. බොහෝ ප්‍රධාන

නගරවල කම්කරුවන් හා හටකායන් අතර බිම් කොටස් අල්ලාගෙන කරන ලද සටන් ඇති කල 1870 ගනන්වල දුම්රිය මාර්ග කම්කරුවන්ගේ වැඩ වර්ජනයෙහි සිට, 1930 ගනන්වල අති විශාල වැඩවර්ජන හා කර්මාන්ත ශාලා අල්ලාගෙන ඒවායෙහි වාඩිලා සිටීම ද, 1960 ගනන්වල සිවිල් අයිතිය පිලිබඳ ව්‍යාපාර හා නගරවල සුලු ජන කොටස් වෙසෙන පෙදෙස්වල කැරලි ගැසීම් ද, 1980 ගනන්වල අති විශාල සේවයෙන් පහකිරීම් හා වෘත්තීය සමිති විනාශ කිරීම්වලට එරෙහිව ඇති වූ සටන් මාලාව ද දක්වා, තත්වය මෙසේ විය.

පසුගිය දශකය ඇමරිකානු කම්කරු පන්තිය වෙත සපයා ඇත්තේ අතිශයින් ම කටුක අත්දැකීමකි. එය, මූල්‍යමය කතිපයාධිපත්‍ය විසින් දියත් කරන ලද අනුකම්පා විරහිත ප්‍රහාරයක ද කම්කරු පන්තියේ පැරනි වෘත්තීය සමිති මුලුමනින් ම වැඳ වැටී සිටීමේ ද ස්වරූපයක් ගෙන ඇත. එසේ වුව ද, එක්සත් ජනපදය තුල පැවතීගෙන එන ප්‍රගාඪ ව විප්ලවීය වූ හා ප්‍රජාතන්ත්‍රීය වූ සම්ප්‍රදායන් නිවාරනය වී නැත. ඒවා, ධනේශ්වර පාලක ප්‍රභුවට විවෘතව ම ප්‍රතිවිරුද්ධ වූ අවශ්‍යතාවන් සහිත ඇමරිකානු කම්කරු පන්තියේ උරුමය වේ.

සිවිල් යුද සමයෙහි සටනට බඳුන් වූ නිදහසට එදිරිව දේපල පිලිබඳ ගැටලුව අද දින ඉතා හදිසියෙන් විසඳිය යුත්තක් සේ අප ඉදිරියේ ඉස්මතුව ඇත. “එක් මිනිසකුගේ නිදහස වෙනත් කෙනෙකුගේ දේපල අන් අයෙකුගේ අයිතිය සමග ගැටෙන විට, පුද්ගලික නිදහස පරම වසයෙන් ම ශුන්‍යයක් සේ” සැලකූ අයව හෙලා දකින ලින්කන්ගේ වදන් යලි සලකා බලන්න.

අද ලොවෙහි සෑම ප්‍රධාන ආන්ඩුවකම පිලිවෙත මෙය නොවේ ද? බහු ජාතික බැංකු හා සංගතවල ලාභ සහතික කරනු වස්, ලෝක ගෝලය වටා කෝටි ගනන් ජනතාව දුප්පත්කම හා සාගින්නට නියම කරන අන්තර් ජාතික සංගත හා සියලු ජාත්‍යන්තර මූල්‍යමය ආයතනවල පිලිවෙත මෙය නොවේ ද?

පවත්නා දේපල පිලිබඳ සබඳතා හා ඒවා නිර්මානය කර ඇති සමාජමය අසමානතා සමග මූලික සමාජමය හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් මුලුමනින් ම අසංගත වේ. මේ විසංවාදය විප්ලවීය අරගලයක නව කාල පරිච්ඡේදයක් ජනිත කල යුතුම ය. අප මැතිවරන ව්‍යාපාරයෙහි ඉලක්කය වනුයේ ඉදිරියේ දී පැනනගින මේ අරගලවලට සූදානම්වීම ය. අප සංකේන්ද්‍රනය වන්නේ නොවැම්බර් 2 වැනි දා ලැබෙන ඡන්ද පෙට්ටි කෙරෙහි නොවේ. මේ මැතිවරනයෙන් අනතුරුව සිදුවන දෑ කෙරෙහි ය. කුමන පාලන අධිකාරියක් ධවල මන්දිරයෙහි පාලනය අත්පත් කර ගත්ත ද, එය තියුනු අර්බුදයකින් යුතු කාල පරිච්ඡේදයක් වනු ඇත.

සැබැවින් ම ස්වාධීන වූ කම්කරු ව්‍යාපාරයක ඉස්මතුවීම වෙනුවෙන් අපි සටන් කරමු. එය ජනිත විය හැක්කේ සමාජවාදී හා ජාත්‍යන්තරවාදී පදනමක් මත පමනි. නොවැම්බර් 2 වැනිදාට පසුව, අපි මේ මැතිවරනයෙහි පාඩම් උකහා ගනිමු. යුද්ධය හා සමාජ ප්‍රතිගාමිත්වයට එරෙහි එකම ඉදිරි මග වන්නේ, බලය අත්පත් කර ගැනීමේ කම්කරු පන්තියේ ලෝක පරිමාන අරගලයෙහි කොටසක් වශයෙන් නව මහා ජන සමාජවාදී ව්‍යාපාරයක් ගොඩනැගීම ය යන ඉදිරි දර්ශනයට කම්කරු පන්තිය නම්මවා ගැනීමේ සටන තව තවත් තියුනු කරමු.

අපට මෙය කල හැක්කේ ලෝක පරිමාන පක්ෂයක කොටසක් වශයෙන් සෑම රටකම කම්කරුවන්ගේ අරගල සවිඥානව එක්සත් කිරීමෙන් පමනි. එමනිසා, අවසානයේ දී, ශ්‍රී ලංකාවෙහි හා ලොව වටා වැඩ කරන ජනතාව ද, මෙරටෙහි හා අන් රටවල අප සහෝදර පක්ෂ විසින් කරන දේශපාලන වැඩ කොටස ද, මෙම ඇමරිකානු මැතිවරනයෙන් ඉදිරියට ගෙන එන තීරනාත්මක ගැටලු විසඳීමෙහි ලා වඩාත්ම ජීවමාන භූමිකාවක් ඉටු කරනු ඇත.■

© www.wsws.org